**ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය**
**පුරප්පාඩු**

මෙම විශ්වවිද්‍යාලයේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම් සහිත අයදුම්කරුවන්ගෙන් 2026.10.05 දින දක්වා අයදුම්පත් කැඳවනු ලැබේ.

**01.** වැඩ අධිකාරී **II** ශ්‍රේණිය **(සිවිල් / විදුලි)**

**අවශ්‍ය සුදුසුකම්:** i. (අ) ජාතික තාක්ෂණ ඩිප්ලෝමා සහතිකපත්‍රය (NDT) හෝ ඊට සමාන සුදුසුකම් සහ එම සුදුසුකම් ලබා ගැනීමෙන් පසු අදාළ ක්ෂේත්‍රය පිළිබඳව අවුරුදු 04 ක පළපුරුද්දක් ලබා තිබීම.

**සටහන :** ඉහත ජාතික තාක්ෂණ ඩිප්ලෝමා පාඨමාලාවට අදාල පුහුණු කාලසීමාව අදාළ ක්ෂේත්‍රය පිළිබඳව ඉල්ලුම් කරනු ලබන අවුරුදු 04ක පළපුරුද්ද ලෙස නොගැනේ.

(ආ) ජාතික තාක්ෂණ සහතිකය (NCT) හෝ ඊට සමාන සුදුසුකම් සහ එම සුදුසුකම් ලබා ගැනීමෙන් පසු අදාළ ක්ෂේත්‍රයේ වසර 10ක පළපුරුද්දක් ලබා තිබීම.

**වයස:** අයදුම්පත් බාර ගන්නා අවසන් දිනට අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**තෝරා ගැනීම:** සම්මුඛ පරීක්ෂණයක් මඟින්

**වැටුප් පරිමාණය :** UMT 1 (I)
රු**.** 65,475 - 6 x 890 ; 13 x 1,190 – 86,285/= (මාසික)

**02.** ඖෂධවේදී පහළ ශ්‍රේණිය

**අවශ්‍ය සුදුසුකම්:** සුදුසුකම් ලත් ඖෂධවේදියෙකු වශයෙන් ශ්‍රී ලංකා වෛද්‍ය සභාවෙන් පිළිගනු ලබන සහතිකයක් ලබා තිබීම.

**වයස:** අයදුම්පත් බාර ගන්නා අවසන් දිනට අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**තෝරා ගැනීම:** සම්මුඛ පරීක්ෂණයක් මඟින්

**වැටුප් පරිමාණය :** UMT 1(III)
රු. 51,095 - 7x540 ; 10 x 640 – 60,575/= (මාසික)

**03. තාක්ෂණික නිලධාරි II ශ්‍රේණිය 'ආ' ඛණ්ඩය**

**අවශ්‍ය සුදුසුකම්** : i. (අ) අ.පො.ස. (උ.පෙළ) විභාගයේ දී ජීව විද්‍යා විෂය ධාරාවෙන් හෝ භෞතික විද්‍යා විෂය ධාරාවෙන් හෝ තාක්ෂණවේදය විෂය ධාරාවෙන් විෂයයන් තුනක් (03) එක් වරකදී සමත් විය යුතුය.

**සහ**

(ආ) අවම වශයෙන් වසරක (පූර්ණ කාලීන) කාල සීමාවක් හෝ ඊට සමාන කාලයක් තුළ තනතුරට අදාළ කුසලතා නැඹුරු විධිමත් පුහුණු වැඩසටහනක් සමත් වීම. මේ සඳහා අවශ්‍ය කරන පුහුණු වැඩසටහනේ පිළිගැනීම අදාළ පීඨය විසින් විනිශ්චය කරනු ලැබේ.

**වයස** : අයදුම්පත් බාරගන්නා අවසන් දිනට අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**තෝරා ගැනීම** : ප්‍රායෝගික පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මඟින්

**වැටුප් පරිමාණය** : UMT 1 (III)
රු. 51,095 – 7 x 540 ; 10 x 640 – 60,575/= (මාසික)

**04. පරිපාලක (සිවිල්) III ශ්‍රේණිය**

**අවශ්‍ය සුදුසුකම්** : (අ) ජාතික තාක්ෂණ සහතිකපත්‍රය (National Certificate in Technology - NCT) හෝ ඊට සමාන සුදුසුකමක් ලබා තිබීම සහ අදාළ ක්ෂේත්‍රයේ වසර 03ක පළපුරුද්දක් තිබීම.

**හෝ**

(ආ) අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේ දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයක් (06) සමත්ව තිබීම සහ රජයේ, පළාත් පාලන ආයතනයක, රාජ්‍ය සංස්ථාවක හෝ පිළිගත් ඉංජිනේරු ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ සුපරීක්ෂක ලෙස අවම වශයෙන් වසර 05ක සේවා පළපුරුද්දක් තිබීම.

**වයස** : අයදුම්පත් බාරගන්නා අවසන් දිනට අවුරුදු 45 ට නොවැඩි විය යුතුය

**තෝරා ගැනීම** : සම්මුඛ පරීක්ෂණයක් මඟින්

**වැටුප් පරිමාණය** : UMT 1 (III)
රු. 51,095 – 7 x 540 ; 10 x 640 – 60,575/= (මාසික)

**05.** පරිපාලක (විදුලි) **III** ශ්‍රේණිය

**අවශ්‍ය සුදුසුකම් :** (අ) ජාතික තාක්ෂණ සහතිකපත්‍රය (National Certificate in Technology - NCT) හෝ ඊට සමාන සුදුසුකමක් ලබා තිබීම සහ අදාළ ක්ෂේත්‍රයේ වසර 03ක පළපුරුද්දක් තිබීම.

**හෝ**

(ආ) අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේ වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයක් (06) සමත්ව තිබීම සහ රජයේ, පළාත් පාලන ආයතනයක, රාජ්‍ය සංස්ථාවක හෝ පිළිගත් ඉංජිනේරු ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ සුපරීක්ෂක ලෙස අවම වශයෙන් වසර 05ක සේවා පළපුරුද්දක් තිබීම.

**වයස :** අයදුම්පත් බාරගන්නා අවසන් දිනට අවුරුදු 45 ට නොවැඩි විය යුතුය

**තෝරා ගැනීම :** සම්මුඛ පරීක්ෂණයක් මඟින්

**වැටුප් පරිමාණය :** UMT 1 (III)
රු. 51,095 – 7 x 540 ; 10 x 640 – 60,575/= (මාසික)

**06.** රියදුරු **III** ශ්‍රේණිය

**අවශ්‍ය සුදුසුකම් :** අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය දෙවරකට නොවැඩි වාර ගණනක දී අවම වශයෙන් සම්මාන සාමාර්ථයන් දෙකක් (02) සහිතව විෂයයන් හයකින් (06) සමත්ව තිබිය යුතු ය.

**සහ**

මෝටර් රථ කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද බර වාහන සඳහා රියදුරු බලපත්‍රයක් තිබීම සහ එම බලපත්‍රය ලබාගැනීමෙන් පසු අවම වශයෙන් වසර තුනක (03) රියදුරු පළපුරුද්දක් තිබිය යුතුය.

**සටහන :** උස අවම වශයෙන් අඩි 5 අඟල් 2 ½ ක් විය යුතුය. දිවා සහ රාත්‍රී සේවා කාලයන්හි රාජකාරි කිරීමට ප්‍රමාණවත් ශාරීරික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු අතර, යහපත් දෘෂ්ටි හැකියාවකින් යුක්ත විය යුතුය.

**වයස :** අයදුම්පත් බාරගන්නා අවසන් දිනට අවුරුදු 18 ට නො අඩු සහ 45 ට නොවැඩි විය යුතුය.

**තෝරා ගැනීම :** වෘත්තීය පරීක්ෂණක් සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟින්

**වැටුප් පරිමාණය :** UPL 3 (III)
රු. 48,005 – 16 x 490 – 55,845 /= (මාසික)

**07.** කාර්මික ශිල්පී **III** ශ්‍රේණිය

**අවශ්‍ය සුදුසුකම් :** තනතුරට අදාළව තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික / වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද N.V.Q. 4 මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

(ඇලුමිනියම් ක්ෂේත්‍රය සම්බන්ධව මනා දැනුමක් සහ ශීතකරණ, වායුසමීකරණ යන්ත්‍ර, ජල පොම්ප සහ විදුලි උපාංගවල දෝෂ සහගත තත්ත්වයන් හඳුනා ගැනීමට ඇති හැකියාව සහ ඒවායේ අලුත්වැඩියා කටයුතු පිළිබඳ දැනුවත්භාවය ඇති අය කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.)

**වයස :** අයදුම්පත් බාර ගන්නා අවසන් දිනට අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**තෝරා ගැනීම :** වෘත්තීය පරීක්ෂණයක් සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟින්

**වැටුප් පරිමාණය :** UPL 3 (III)
රු. 48,005 – 16 x 490 – 55,845/= (මාසික)

**08.** ට්‍රැක්ටර් ක්‍රියාකරු **III** ශ්‍රේණිය

**අවශ්‍ය සුදුසුකම් :**

1. අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය දෙවරකට නොවැඩි වාර ගණනක දී අවම වශයෙන් සම්මාන සාමාර්ථයන් දෙකක් (02) සහිතව විෂයයන් හයකින් (06) සමත්වී තිබීම සහ එකී තනතුරේ කාර්යයන්ට අදාළ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික / වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) මට්ටම 2 හෝ 3 ට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම. (පාඨමාලාවට අදාළ ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම (NVQ Level) තහවුරු කිරීම සඳහා තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (Tertiary and Vocational Education Commission) මඟින් නිකුත් කරන සමානතා සහතිකයක් (Certificate of Equivalence) ඉදිරිපත් කළ යුතුය.

**හෝ**

2. අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය දෙවරකට නොවැඩි වාර ගණනක දී අවම වශයෙන් සම්මාන සාමාර්ථයන් දෙකක් (02) සහිතව විෂයයන් හයකින් (06) සමත්වී තිබීම සහ කාර්මික කුසලතා සහිත අදාළ ක්ෂේත්‍රයේ වසරක (01) සේවා පළපුරුද්දක් ලබාගෙන තිබීම.

**සටහන :** අවම උස අඩි 5 අඟල් 2 ½ ක් විය යුතුය. දිවා සහ රාත්‍රී සේවා කාලයන්හි රාජකාරි කිරීමට ප්‍රමාණවත් ශාරීරික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු අතර, යහපත් දෘෂ්ටි හැකියාවකින් යුක්ත විය යුතුය.

**වයස :** අයදුම්පත් බාරගන්නා අවසන් දිනට අවුරුදු 18 ට නො අඩු සහ 45 ට නොවැඩි විය යුතුය.

**තෝරා ගැනීම :** වෘත්තීය පරීක්ෂණක් සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟින්

**වැටුප් පරිමාණය :** U-PL 2 (III)
රු. 44,575 – 16 x 490 – 52,415/= (මාසික)

**09.** **විද්‍යාගාර සහායක III ශ්‍රේණිය**

**අවශ්‍ය සුදුසුකම්** : 1. අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය දෙවරකට නොවැඩි වාර ගණනක දී අවම වශයෙන් සම්මාන සාමාර්ථයන් දෙකක් (02) සහිතව විෂයයන් හයකින් (06) සමත්වී තිබීම සහ එකී තනතුරේ කාර්යයන්ට අදාළ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික / වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) මට්ටම 2 හෝ 3 ට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම. (පාඨමාලාවට අදාළ ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම (NVQ Level) තහවුරු කිරීම සඳහා තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (Tertiary and Vocational Education Commission) මඟින් නිකුත් කරන සමානතා සහතිකයක් (Certificate of Equivalence) ඉදිරිපත් කළ යුතුය.

හෝ

2. අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය දෙවරකට නොවැඩි වාර ගණනක දී අවම වශයෙන් සම්මාන සාමාර්ථයන් දෙකක් (02) සහිතව විෂයයන් හයකින් (06) සමත්වී තිබීම සහ කාර්මික කුසලතා සහිත අදාළ ක්ෂේත්‍රයේ වසරක (01) සේවා පළපුරුද්දක් ලබාගෙන තිබීම.

**වයස** : අයදුම්පත් බාරගන්නා අවසන් දිනට අවුරුදු 18 ට නො අඩු සහ 45 ට නොවැඩි විය යුතුය.

**තෝරා ගැනීම** : වෘත්තීය පරීක්ෂණක් සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟින්

**වැටුප් පරිමාණය** : U-PL 2 (III)
රු. 44,575 – 16 x 490 – 52,415/= (මාසික)

**10.** **සෞඛ්‍ය සේවා කම්කරු III ශ්‍රේණිය**

**අවශ්‍ය සුදුසුකම්** : අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයට පෙනී සිටිය යුතුය.

**වයස** : අයදුම්පත් බාර ගන්නා අවසන් දිනට අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**තෝරා ගැනීම** : වෘත්තීය පරීක්ෂණයක් හා / හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟින්

**වැටුප් පරිමාණය** : UPL 1 (III)
රු.42,775 – 16 x 450 – 49,975/= (මාසික)

ඉහත මූලික වැටුපට අමතරව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව අනුමත කරන ලද අනෙකුත් දීමනා ද අදාළ රෙගුලාසිවලට අනුව ගෙවනු ලැබේ.

i. ජීවන වියදම් දීමනාව - රු.17,800.00
ii. MCA දීමනාව - මූලික වැටුපෙන් 36% - රු.330/=

**සටහන** **:** සෑම අයදුම්කරුවෙකුම;

(i) ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතු ය.

(ii) දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය ඉටු කිරීමට සහ තනතුරේ රාජකාරී හොඳින් ඉටු කිරීමට ශාරීරිකව හා මානසිකව යෝග්‍ය විය යුතුය.

(iii) යහපත් චරිතයකින් යුක්ත විය යුතු ය.

**සේවා කොන්දේසි**

1. මෙය ස්ථිර තනතුරකි. පත්වීම් වසර තුනක (03) ක පරිවාස කාලයක් සඳහා යටත්වය.

2. තෝරාගත් අපේක්ෂකයින් දැනට රජයේ දෙපාර්තමේන්තුවක සේවය කරයි නම් ඔහුගේ / ඇයගේ අදාළ පත්වීම් අධිකාරිය හරහා තම නිදහස් කිරීම ලබා ගත යුතුය.

3. විශ්වවිද්‍යාල සේවයේ යෙදී සිටියදී රජයේ සේවකයින්ට ඔවුන්ගේ විශ්‍රාම වැටුප් අයිතිවාසිකම් පවත්වා ගැනීමට අයිතියක් නොමැත.

**ප්‍රතිලාභ**

1. තෝරාගත් අපේක්ෂකයින් තම ඉපයීම් වලින් සියයට දහයකට (10%) සමාන මුදලක් මාසිකව අඩු කිරීමෙන් විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලට දායක විය යුතු අතර ඊට අමතරව විශ්වවිද්‍යාලය තම අරමුදල්වලින් තම ඉපයීම්වලින් සියයට හතකට (07%) සමාන මුදලක් විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලට සහ තම ඉපයීම්වලින් සියයට අටකට (08%) සමාන මුදලක් විශ්‍රාම වැටුප් අරමුදලට දායක කරනු ඇත.

2. සේවක භාර අරමුදල ප්‍රතිපාදන අනුව විශ්වවිද්‍යාලය විසින් ඔහුගේ / ඇයගේ මූලික වැටුපෙන් සියයට තුනක් (03%) සේවක භාර අරමුදලට දායක කරනු ඇත.

**අයදුම්පත් ඉදිරිපත් කළයුතු ආකාරය**

www.sab.ac.lk /Vacancies යන විශ්වවිද්‍යාල වෙබ් අඩවියෙන් “අයදුම්පත්” බාගත කර ගත හැකිය.

රාජ්‍ය සේවයේ / සංස්ථා / ව්‍යවස්ථාපිත මණ්ඩලවල අයදුම්කරුවන් තම අයදුම්පත් අදාළ ප්‍රධානීන් හරහා ඉදිරිපත් කළ යුතුය. විශ්වවිද්‍යාල වෙබ් අඩවියෙන් බාගත කර ගන්නා ලද නිසි ලෙස සම්පූර්ණ කරන ලද අයදුම්පත්, උපාධි සහතික, වෘත්තීය සහතික ආදියෙහි සහතික කළ පිටපත් සමඟ **2026.10.05** දිනට හෝ ඊට පෙර **සහකාර ලේඛකාධිකාරි / අනධ්‍යයන ආයතන, ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය, තැ.පෙ. 02, බෙලිහුල්ඔය** යන ලිපිනයට ලැබෙන පරිදි ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ ඉල්ලුම් කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතුය. අයදුම්පත් යොමු කිරීම සම්බන්ධයෙන් අවශ්‍ය ඕනෑම ලිපි හුවමාරුවක් හෝ විමසීමක් සඳහා 045-2280047 අංකය හරහා අප හා සම්බන්ධ විය හැකිය.

අවශ්‍ය විස්තර සඳහන් කර නොමැති හෝ අසම්පූර්ණ අයදුම්පත් හෝ ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් හෝ අනෙකුත් නියමිත අවශ්‍යතාවයන් සපුරා නොමැති අයදුම්පත් කිසිදු හේතුවක් නොදක්වා ප්‍රතික්ෂේප කරනු ලබන අතර, එවැනි අයදුම්පත් කිසිදු හේතුවක් නිසා යළි සලකා බලනු නොලැබේ.

වැඩ බලන ලේඛකාධිකාරි<br>
ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය<br>
2026.09.17